# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/16 - 2017 නොවැම්බර් මස 22 වැනි බදදා - 2017.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : DEV/LND/02/ACQUI/04-8.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/15/2012/වීඊ/158.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාඹටුන්න ග්‍රාම නිලධාරි වසමේ, නාඹටුන්න ගමේ පිහිටි මාර/2586 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 0.8215ක් පමණ):

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කන්දෙගෙහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු. 30-40 ක් පමණ වයසැති පොල්ගස් 7ක්, අවු. 10-15 ක් පමණ වයසැති අඹ ගස් 1ක්, අවු. 10 ක් පමණ වයසැති තේක්ක ගස් 3ක්, අවු. 15-20 පමණ වයසැති තේක්ක ගස් 1ක්, අවු. 10-15 ක් පමණ වයසැති කොස් ගස් 1 ක් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.8215.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2017.12.15 දින පෙරවරු 10.00 ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.11.29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

රංජිත් යාපා,
අත්කර ගැනීමේ නිලධාරි/ප්‍රාදේශීය ලේකම්,
දෙවිනුවර.

2017 ඔක්තෝබර් මස 25 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 109


1A - G 26629 - 24 (2017/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.